# මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
# MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES



මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01, இலங்கை.

The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823

වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/GPS/13/01/12/2023

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.06.16

අයවැය චක්‍රලේඛ අංක: 03/2023

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් ප්‍රධානීන්

**නව සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රමානුකූලව ඇගයීම සඳහා වන ජාතික සංවර්ධන කමිටුවට අදාල මාර්ගෝපදේශ මාලාව**

2023 අයවැය කතාවේ දී ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් නව සංවර්ධන ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රමානුකූලව ඇගයීම සඳහා වන ජාතික සංවර්ධන කමිටුව (මින් මතු කමිටුව ලෙස හඳුන්වන) පිහිටුවීම සම්බන්ධයෙන් යෝජනාව ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, 2023.05.23 දින එම කමිටු ව්‍යුහය සහ ඔවුන්ගේ වගකීම් සම්බන්ධයෙන් ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි, එම කමිටුව 2023-05-26 දින ස්ථාපිත කර ඇත.

2048 වසරේ දී රට සංවර්ධිත රාජ්‍යයක් බවට පත්කිරීමේ අරමුණ ළඟාකර ගැනීම උදෙසා ව්‍යාපෘති සඳහා යොදන රාජ්‍ය වියදම් විචක්ෂණශීලීව හා ඵලදායී ලෙස යෙදවීම මඟින් ඒවායේ අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකර ගැනීම තහවුරු කිරීමට, ව්‍යාපෘති යෝජනා සමස්තයක් ලෙස සලකා ඇගයීමක් මෙම කමිටුව විසින් සිදුකරනු ඇත. මෙම කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත අවසන් නිර්දේශ ලබා දෙනු ඇති අතර, කමිටුව සති දෙකකට වරක් රැස්වීමට අපේක්ෂා කෙරේ.

1. **කමිටුවේ විෂය පථය**

   අ) ව්‍යාපෘති / වැඩසටහන් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලවන බවට සහතික කිරීම.

   ආ) ව්‍යාපෘති / වැඩසටහන් වල ශක්‍යතාව සහතික කිරීම.

   ඇ) ව්‍යාපෘති / වැඩසටහන් වල අන්තර් ආංශික පෙළගැස්ම සහතික කිරීම.

   ඈ) රජයේ සංවර්ධන ප්‍රමුඛතා සමඟ ව්‍යාපෘති/ වැඩසටහන් වල ප්‍රමුඛතාවය පරීක්ෂා කිරීම.

   ඉ) ජාතික අවශ්‍යතා සහ ව්‍යාපෘති ප්‍රතිලාභ සහතික කිරීම.

   ඊ) ජාතික ආර්ථිකයට සහ ජනතාවගේ සුබසාධනයට ව්‍යාපෘතියේ / වැඩසටහන්වල බලපෑම පරීක්ෂා කිරීම.

එ) ආයෝජනයේ ප්‍රතිලාභ සහතික කිරීම.

ඒ) පාරිසරික සම්බන්ධීකරණය සහතික කිරීම.

ඓ) ව්‍යාපෘති ස්ථානය සහ කාල රාමුවේ යෝග්‍යතාවය සහතික කිරීම.

ඔ) ණය මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ණය ආපසු ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීම.

ඕ) එක් එක් ව්‍යාපෘති / වැඩසටහන් වලට අදාළ කමිටු නිර්දේශ, සලකා බැලීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ රේඛීය අමාත්‍යාංශය හරහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

## 2. කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනා

දැනට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවට අදාළ වන අධිකාරී බල සීමාවන්ට සමාන හෝ ඊට වැඩි මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද සහ පහත සඳහන් ඕනෑම කාණ්ඩයකට ඇතුළත් වන ව්‍යාපෘති මෙම කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

1. සියලුම නව ව්‍යාපෘති යෝජනා
2. ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිවල විෂය පථය සංශෝධනය කිරීම
3. ඉහත වියදම් සීමාව තුළ ඕනෑම ආකාරයක රජයේ බැඳීම් සහිත නව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතීන් (PPP)
4. 2018/06/01 දිනට පසුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද නමුත් තවමත් ක්‍රියාත්මක කර නොමැති ව්‍යාපෘති යෝජනා
5. 2018/06/01 ට පෙර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද ව්‍යාපෘති යෝජනා, තවමත් ක්‍රියාත්මක කර නොමැති නම්, අවශ්‍ය වන විට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත නව යෝජනාවක් ලෙස නැවත ඉදිරිපත් කළ යුතුය.

## 3. අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

1. සියලුම ව්‍යාපෘති සහ වැඩසටහන් සකස් කර 2019/01/10 දිනැති ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක: MNPEA 02/2019 හි උපදෙස් අනුව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

2. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ඉහත 2 ඡේදය යටතේ ආවරණය වන, නිර්දේශිත ව්‍යාපෘති පමණක් සිය නිර්දේශ ද සහිතව කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

3. කමිටුව අවශ්‍ය යැයි දැන්වුවහොත්, අදාළ රේඛීය අමාත්‍යාංශ හෝ නියෝජිතායතන අදාළ තොරතුරු සමඟ කමිටුව හමුවේ පෙනී සිටිය යුතුය.

4. කමිටුව විසින් අදාළ වන පරිදි, ජනාධිපති ලේකම්, විගණකාධිපති, අමාත්‍ය මණ්ඩල ලේකම්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාළ අනෙකුත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වෙත පිටපත් ද සමඟ අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දෙනු ඇත.

5. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට ඇගයීමට සහ කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කාලය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් රේඛීය අමාත්‍යාංශය විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු චක්‍රලේඛයට අනුව සකස් කර ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළ යුතුය.

6. ව්‍යාපෘතිය / වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමේ දී කමිටු නිර්දේශ ද අමාත්‍ය මණ්ඩල සංදේශය සමඟ අමුණා තිබිය යුතුය.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) කමිටුවට අදාළ කාර්යයන් සඳහා පහසුකම් සැලසීමේ ලේකම් කාර්යාලය ලෙස ක්‍රියා කරන අතර, මෙම චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, රසික විජේකෝන් මහතා 011-2484690 යන දුරකථන අංකය හරහා සම්බන්ධ කර ගත හැකිය.

**අත්.කළේ/ ඒ.කේ. සෙනෙවිරත්න**
**භාණ්ඩාගාර ලේකම් (වැ.බ.)**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, මුදල් කොමිෂන් සභාව